මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

නිකුත් කළේ සන්නිවේදන දෙපාර්තමේන්තුව
දිනය 2021.11.08

# කොවිඩ්-19 වසංගතයෙන් බලපෑමට පත් ව්‍යාපාර සහ පුද්ගලයන්ට ලබා දුන් ණය සහන රුපියල් බිලියන 4,000 ඉක්මවා ඇත: සෞභාග්‍යා ණය රුපියල් බිලියන 179ක අගය පසු කරයි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධීක්ෂණය කරනු ලබන මූල්‍ය ආයතන මඟින් කොවිඩ්-19 හේතුවෙන් බලපෑමට පත් ණය ගනුදෙනුකරුවන්ට සහාය ලබා දීමට ශ්‍රී ලංකා මහ බැංකුව යෝජනා ක්‍රම කිහිපයක් ක්‍රියාත්මක කර ඇත. කොවිඩ්-19 හේතුවෙන් බලපෑමට පත් ණය ගනුදෙනුකරුවන් සඳහා ණය ආපසු ගෙවීමේ කාලය දීර්ඝ කිරීම, සහනදායී පොලී අනුපාතික, කාරක ප්‍රාග්ධන ණය, ණය සහන සහ ණය පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීම/ ප්‍රතිලේඛනගත කිරීම මෙම යෝජනා ක්‍රම වලට ඇතුළත් විය.

සංචාරක, ඇඟලුම්, වැවිලි, තොරතුරු තාක්ෂණය, කාර්ය සම්පාදන සේවා සැපයුම්කරුවන්, ත්‍රිරෝද රථ හිමිකරුවන්, පාසල් වෑන් රථ ක්‍රියාකරුවන්, ලොරි රථ, කුඩා භාණ්ඩ ප්‍රවාහන රථ හා බස් රථ වැනි බලපෑමට පත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර බොහොමයකට සහ පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ට මෙම සහන බෙහෙවින් උපකාරී වී ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලැබූ සහන යෝජනා ක්‍රම වලට අනුගත වෙමින්, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ප්‍රමුඛත්වය ලබා දෙමින් මූල්‍ය ආයතන විසින් මිලියන 2.9 කට අධික ඉල්ලීම් ප්‍රමාණයක් අනුමත කරමින් සමස්තයක් ලෙස රුපියල් බිලියන 4,083.8 ක අගයකින් යුත් ණය සහන ලබා දෙන ලදී (වගු අංක 1). බලපත්‍රලාභී බැංකු විසින් 2021.12.31 දක්වා සහ බැංකු නොවන මූල්‍ය ආයතන විසින් 2022.03.31 දක්වා දීර්ඝ කරන ලද මෙම සහන, රැකියා අහිමි වීම, ආදායම් අඩු වීම, ව්‍යාපාර කටයුතු දුර්වල වීම, ව්‍යාපාර වසා දැමීම යනාදී කරුණු හේතුවෙන් මූල්‍ය දුෂ්කරතාවලට මුහුණ දුන් ඉහත පාර්ශවයන් වෙත ලබා දීමට කටයුතු කර ඇත.

2019 වර්ෂයේ සිට බලපෑමට ලක් ව ඇති සංචාරක ක්ෂේත්‍රය සැලකිල්ලට ගනිමින්, එම ක්ෂේත්‍රයේ බලපෑමට පත් වූ ණය ගනුදෙනුකරුවන් සඳහා  විශේෂ යෝජනා ක්‍රම කලින් කලට හඳුන්වා දීම අඛණ්ඩව සිදු කෙරුණු අතර, ඒවා බලපත්‍රලාභී බැංකු විසින් 2022.06.30 වන දින තෙක් ද, බැංකු නොවන මූල්‍ය ආයතන විසින් 2022.03.31 දින තෙක් ද දීර්ඝ කරන ලදී. ඒ අනුව, මූල්‍ය ආයතන විසින් එවැනි සහන සඳහා ඉල්ලීම් 24,831ක් මෙතෙක් අනුමත කර ඇත (වගු අංක 2).

කල්බදු පහසුකම්, මඟී ප්‍රවාහන ක්ෂේත්‍රයේ නිරත ව්‍යාපාර සහ පුද්ගලයන් සඳහා ලබා දී ඇති කල්බදු මූල්‍යකරණ පහසුකම් සඳහා වන ණය සහන වැනි විශේෂිත සහන 2021.09.30 දක්වා ආරම්භයේ දී ලබා දුන් අතර, අනතුරුව බලපත්‍රලාභී බැංකු විසින් 2021.12.31 වන දින තෙක් ද බැංකු නොවන මූල්‍ය ආයතන විසින් 2022.03.31 දින තෙක් ද දීර්ඝ කරන ලදී. මූල්‍ය ආයතන විසින් එවැනි සහන සඳහා ඉල්ලීම් 117,085 ක් අනුමත කර ඇත (වගු අංක 3).

ණය සහනවලට අමතරව, බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ බලපෑමට පත් වූ ණය ගනුදෙනුකරුවන්ට ණය පහසුකම් දීර්ඝ කාලයක් සඳහා ප්‍රතිව්‍යුහගත කිරීම (පිළිගත හැකි නගා සිටුවීමේ සැලැස්මක් පිළියෙල කිරීමට යටත්ව) නැතහොත් පවතින ණය පහසුකම්, අනාගත පොලිය, ගාස්තු සහ අදාළ අය කිරීම් කපා හැරීම මඟින් පූර්ව පියවීම සඳහා පහසුකම් සලසා ඇත. බැංකු නොවන මූල්‍ය ආයතනවල ණය ගනුදෙනුකරුවන් සඳහා මෙම විකල්ප 2022.03.31 දක්වා ලබා දී ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගෙවිය යුතු දඩ පොලිය කපා හැරීම, පවතින ණය පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීම, පොලී ප්‍රතිදාන සැපයීම, පූර්ව පියවීමේ ගාස්තු සහ අනෙකුත් ගාස්තු කපා හැරීම, ණය ආපසු අය කර ගැනීමේ දී ගන්නා නීතිමය ක්‍රියාමාර්ග අත්හිටු වීම, රුපියල් 500,000ට අඩු අගයකින් යුත් චෙක්පත්වල වලංගු කාලය දීර්ඝ කිරීම, මූල්‍ය ආයතන විසින් සාමාන්‍යයෙන් අය කරනු ලබන ඇතැම් ගාස්තු (අගරු චෙක්පත්, ගෙවීම් නැවැත්වීම යනාදිය සඳහා) අත්හිටු වීම සහ සහන කාලය තුළ දී ණයපත් මත අය කරනු ලබන ප්‍රමාද ගෙවීම් ගාස්තු අත්හිටු වීම ඇතුළු සහන තවදුරටත් ලබා දෙන මෙන් මූල්‍ය ආයතන වෙත දැනුම් දෙන ලදී. හුදෙක්ම අසතුටුදායක

ණය තොරතුරු කාර්යාංශ වාර්තා මත පමණක් පදනම්ව, සුදුසු ණය ගනුදෙනුකරුවන් ගෙන් ලැබෙන ණය අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමෙන් වළකින මෙන් ද මූල්‍ය ආයතන වෙත දැනුම් දී ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කොවිඩ්-19 වසංගතය හේතුවෙන් පීඩාවට පත් ව්‍යාපාර යළි නඟා සිටුවීම සඳහා අදියර 3 ක් යටතේ සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන ලදී. මාස 6ක සහන කාලයක් ද ඇතුළුව, මාස 24 ක් දක්වා ණය ආපසු ගෙවීමේ කාලයක් සහිතව වසරකට 4% ක පොලී අනුපාතිකයක් යටතේ කාරක ප්‍රාග්ධන ණය සැපයීමට මෙම යෝජනා ක්‍රමය ඔස්සේ පහසුකම් සලසන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙම සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද ණය සහන යෝජනා ක්‍රමය යටතේ රුපියල් මිලියන 179,280 ක ප්‍රමාණයකින් යුතු අයදුම්පත් 62,574 ක් අනුමත කරනු ලැබූ අතර, බලපත්‍රලාභී බැංකු විසින් එයින් රුපියල් මිලියන 165,513 ක මුදලක් දිවයින පුරා විසිරී සිටින පීඩාවට පත් ව්‍යාපාර 53,152 ක් අතර බෙදා හරින ලදී. කොවිඩ් -19 වසංගතයේ දෙවන සහ තෙවන රැලි සැලකිල්ලට ගනිමින්, සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම යටතේ ලබා දුන් ණය සඳහා අදාළ වන සහන කාලය සහ ණය ආපසු ගෙවීමේ කාලය කිහිප වතාවක් දීර්ඝ කරන ලදී. ඒ අනුව, 2021. 12. 31 වන දින දක්වා ණය සහන කාලයක් ලබා දුන් අතර, ණය ආපසු ගෙවීමේ කාලය මාස 12 සිට මාස 36 ක් දක්වා දීර්ඝ කරනු ලැබීය. මීට අමතරව, සෞභාග්‍යා සහ ස්වශක්ති යනා දී ණය යෝජනා ක්‍රම සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද අනිකුත් ණය යෝජනා ක්‍රම යටතේ ණය ලබා ගත් ප්‍රතිලාභීන් සඳහා ද පොලී අඩු කිරීම් සහ ණය සහන කාලයන් හඳුන්වා දීම තුළින් මෙම තීරණාත්මක අවස්ථාවේ දී තවදුරටත් සහන සලසන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සාර්ව ආර්ථික සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව සහතික කිරීම සඳහා මෑත කාලීනව හඳුන්වා දුන් සය මාසික පෙර දැක්මෙහි ප්‍රකාශයට පත් කළ පරිදි, ණය ගනුදෙනුකරුවන් සඳහා තවදුරටත් සහන ලබා දීම අරමුණු කර ගනිමින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධීක්ෂණය කරනු ලබන මූල්‍ය ආයතන සඳහා සහන කාලය තුළ බලපෑමට ලක් වූ ණය ගනුදෙනුකරුවන්ගෙන් ඔවුන් අය කරනු

ලබන පොලී මුදලින් කොටසක් පියවීම සඳහා රුපියල් බිලියන 15ක ද්‍රවශීලතා ආධාරක ප්‍රතිපාදනයක් සපයනු ඇත.

මේ අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියේ ඇති ආකෘති පත්‍ර උපයෝගී කර ගනිමින් මූල්‍ය පාරිභෝගික සහ ණය ගනුදෙනුකරුවන් යොමු කරනු ලබන පැමිණිලි හා සම්බන්ධ සේවා සැපයීම සඳහා 2020 අගෝස්තු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී.

## වගුව 1: කොවිඩ් -19 වසංගතයෙන් බලපෑමට ලක්වූ ණය ගනුදෙනුකරුවන් සඳහා ලබා දුන් සහන

| ණය සහන අදියර | බලපත්‍රලාභී බැංකු | | | | බැංකු නොවන මූල්‍ය ආයතන | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ලැබුණු ඉල්ලීම් ගණන | අනුමත ඉල්ලීම් ගණන | අනුමත ඉල්ලීම් ගණන ප්‍රතිශත යක් ලෙස | නොපියවූ ප්‍රාග්ධනය (රු.බිලියන) | ලැබුණු ඉල්ලීම් ගණන | අනුමත ඉල්ලීම් ගණන | අනුමත ඉල්ලීම් ගණන ප්‍රතිශත යක් ලෙස | නොපියවූ ප්‍රාග්ධනය (රු.බිලියන) |
| කොවිඩ් -19 (පළමු රැල්ල) | 1,435,119 | 1,336,136 | 93.10 | 2,280.7 | 985,063 | 847,491 | 86.03 | 355.3 |
| කොවිඩ් -19 (දෙවන රැල්ල) | 136,184 | 121,530 | 89.24 | 726.9 | 143,382 | 111,038 | 77.44 | 62.1 |
| කොවිඩ් -19 (තෙවන රැල්ල) | 171,511 | 154,841 | 90.28 | 552.4 | 393,893 | 356,634 | 90.54 | 106.4 |
| සමස්තය | **1,742,814** | **1,612,507** | **92.52** | **-** | **1,522,338** | **1,315,163** | **86.39** | **-** |

## වගුව 2: සංචාරක ක්ෂේත්‍රය සඳහා ලබා දුන් සහන

| ණය සහන අදියර | බලපත්‍රලාභී බැංකු | | | | බැංකු නොවන මූල්‍ය ආයතන | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ලැබුණු ඉල්ලීම් ගණන | අනුමත ඉල්ලීම් ගණන | අනුමත ඉල්ලීම් ගණන ප්‍රතිශත යක් ලෙස | නොපියවූ ප්‍රාග්ධනය (රු.බිලියන) | ලැබුණු ඉල්ලීම් ගණන | අනුමත ඉල්ලීම් ගණන | අනුමත ඉල්ලීම් ගණන ප්‍රතිශතය ක් ලෙස | නොපියවූ ප්‍රාග්ධනය (රු.බිලියන) |
| සංචාරක ක්ෂේත්‍රය (පළමු අදියර) | 5,919 | 4,258 | 71.94 | 113.9 | 1,441 | 1,389 | 96.39 | 3.6 |
| සංචාරක ක්ෂේත්‍රය (දෙවන අදියර) | 6,903 | 5,961 | 86.35 | 214.0 | 6,485 | 5,792 | 89.31 | 5.6 |
| සංචාරක ක්ෂේත්‍රය (තෙවන අදියර) | 7,318 | 6,351 | 86.79 | 220.1 | 1,266 | 1,080 | 85.31 | 1.8 |
| සමස්තය | **20,140** | **16,570** | **82.27** | **-** | **9,192** | **8,261** | **89.87** | **-** |

## වගුව 3: මගී ප්‍රවාහන සේවය සඳහා ලබා දුන් සහන

| ණය සහන | බලපත්‍රලාභී බැංකු | | | | බැංකු නොවන මූල්‍ය ආයතන | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ලැබුණු ඉල්ලීම් ගණන | අනුමත ඉල්ලීම් ගණන | අනුමත ඉල්ලීම් ගණන ප්‍රතිශත යක් ලෙස | නොපියවූ ප්‍රාග්ධනය (රු.බිලියන) | ලැබුණු ඉල්ලීම් ගණන | අනුමත ඉල්ලීම් ගණන | අනුමත ඉල්ලීම් ගණන ප්‍රතිශතය ක් ලෙස | නොපියවූ ප්‍රාග්ධනය (රු.බිලියන) |
| කල්බදු මූල්‍යකරණ පහසුකම් | 883 | 809 | 91.62 | 3.2 | 122,591 | 116,276 | 94.85 | 33.4 |

* එකම ණය ගනුදෙනුකරු විවිධ යෝජනා ක්‍රම/ අදියර යටතේ සහන ලබාගෙන තිබිය හැක.